# අරුම පුදුම රාවු අලය

රුසියානු ජන කතාවකි


එක් මහලු ගොවිරාල කෙනෙක්
එයාගෙ ගොවිපළේ රාබු පැළයක්
හිටෙව්වා. ඒ රාබු පැළය දවසට දෙකට
ලොකු වෙලා
විශාල ගසක් වුණා.


ගොවිරාලට හරිම සතුටුයි.
එයා හාමිනේටත් කතා කළා.
හාමිනේටත් හරිම සතුටුයි.


හාමිනේ මිනිපිරිටත් කතා කළා...
එයාට හරිම පුදුමයි...
රාබු ගහ එයාටත් වඩා උසයි...


ගොවිරාල හිතුවා රාබු ගහ උගුලන්න...
එයා රාබු ගහ අල්ලා ඇද්දා... ඇද්දා...
රාබු ගහ හෙලවුණේවත් නැහැ...
හාමිනේත් එකතු වෙලා ඇද්දා... ඇද්දා...
රාබු ගහ හෙලවුණේවත් නැහැ...

හාමිනේ මිනිපිරිට කතා කළා...
මිනිපිරී ඇවිත් හාමිනේ අල්ලා ගත්තා...
හාමිනේ ගොවිරාල අල්ලා ගත්තා...
ගොවිරාල රාබු ගහ අල්ලාගෙන
ඇද්දා... ඇද්දා... ඒත් රාබු ගහ
හෙලවුණේවත් නැහැ...

මිනිපිරී බල්ලාට කතා කළා.
බල්ලා ඇවිත් මිනිපිරී අල්ලා ගත්තා...
මිනිපිරී හාමිනේ අල්ලා ගත්තා...
හාමිනේ ගොවිරාල අල්ලා ගත්තා....
ගොවිරාල රාබු ගහ අල්ලාගෙන ඇද්දා... ඇද්දා...
රාබු ගහ හෙලවුණේවත් නැහැ...

බල්ලා පූසාට කතා කළා.
පූසා ඇවිත් බල්ලා අල්ලා ගත්තා...
බල්ලා මිනිපිරි අල්ලා ගත්තා...
මිනිපිරි හාමිනේ අල්ලා ගත්තා...

හාමිනේ ගොවිරාල අල්ලා ගත්තා...
ගොවිරාල රාබු ගහ අල්ලාගෙන
ඇද්දා... ඇද්දා...
රාබු ගහ හෙලවුණේවත් නැහැ.

පූසා මීයාට කතා කළා.
මීයා ඇවිත් පූසා අල්ලා ගත්තා...
පූසා බල්ලා අල්ලා ගත්තා... බල්ලා
මිනිපිරී අල්ලා ගත්තා...


මිනිපිරී හාමිනේ අල්ලා ගත්තා...
හාමිනේ ගොවිරාල අල්ලා ගත්තා...
ගොවිරාල රාබු ගහ අල්ලාගෙන ඇද්දා... ඇද්දා...
අන්තිමේදී රාබු ගහ ගැලවිලා ආවා.

# අරුම පුදුම රාබු අලය

රුසියානු ජන කතාවකි

ඉංග්‍රීසි බසින් සිංහල බසට පරිවර්තනය

**සරත් කෝදාගොඩ**

මුද්‍රණය: මධු ප්‍රින්ටින් වර්ක්ස්
351/ඒ, නව නුවර පාර,
දෙල්ගොඩ.
දුර: 0779334211-2

කුරුලු පොත් ප්‍රකාශකයෝ
594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/0718263282

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

ISBN 978-955-591-317-1

මිල රු. 150/=